www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එල්ටීටීඊ නායකයා ඝාතනය කිරීම ශ්‍රී ලංකාවේ යුද අනතුර ඉහල නංවයි

## Killing of LTTE leader raises danger of war in Sri Lanka

**විලානි පීරිස් සහ කේ. රත්නායක විසිනි**
**2005 පෙබරවාරි 11**

සඳුදා ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයේ දී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ ඉහල පෙල නායකයකු ඝාතනය කිරීම රට තුල සිවිල් යුද්ධය යලි ඇවිලවීමේ අනතුර උත්සන්න කරයි. ශ්‍රී ලංකා ආන්ඩුව ඝාතනය හෙලා දකිද්දී ප්‍රහාරයට කුමන්ත්‍රනය කිරීම පිලිබඳව එල්ටීටීඊය මිලිටරියට චෝදනා කල අතර මෙය ''සාම සාකච්ඡා යලි ඇරඹීම''ට සහ ''මානුෂීය සහන සේවාවන්ට බරපතල බලපෑමක්'' වනු ඇතැයි අනතුරු ඇඟවී ය.

නැගෙනහිර පලාතේ එල්ටීටීඊ දේශපාලන නායකයා වූ ඊ. කෞශලයන් රජයේ පාලනයේ වන උතුරු මැද පලාතේ වැලිකන්ද ප්‍රදේශය අසල දී මරා දැමුනේ තවත් එල්ටීටීඊ සාමාජිකයන් තුන් දෙනකු ද සමග ය. කෞශලයන් සමග ගමන් කල හිටපු දෙමල ජාතික සන්ධාන (ටීඑන්ඒ) මන්ත්‍රී වරයකු වූ ඒ. චන්ද්‍රනේරු තුවාල ලැබූ අතර පසුව රෝහලේ දී මිය ගියේ ය. දිවි ගලවා ගත්තේ චන්ද්‍රනේරුගේ පොලිස් ආරක්ෂකයින් දෙදෙනා සහ පස්වැනි එල්ටීටීඊ සාමාජිකයා පමනක් ය.

2002 පෙබරවාරියේ දී කොලඹ සහ එල්ටීටීඊය අතර සටන් විරාම එකඟතාවයක් ගිවිසගැනීමෙන් අනතුරුව මරා දැමුනු ජ්‍යෙෂ්ඨතම එල්ටීටීඊ නායකයා කෞශලයන් ය. එල්ටීටීඊ ප්‍රකාශයකට අනුව ඔහු කිලිනොච්චි එල්ටීටීඊ බල කඳවුරේ දී එල්ටීටීඊ නායකත්වය සමග සහන කටයුතු පිලිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව නැගෙනහිරට ආපසු එමින් සිටියේ ය. ශ්‍රී ලංකාවේ 40,000කට මරු කැඳවමින් බොහෝ වෙරල බඩ ප්‍රදේශ වනසා දැමූ දෙසැම්බර් 26 සුනාමියේ සම්පූර්න බලපෑමට නැගෙනහිර වෙරල තීරය ගොදුරු විය.

පැහැදිලිවම සටන් විරාමයට වලකැපීම සඳහා එල්ල කැරුන ඝාතනය මගින් බදාදා සහ බ්‍රහස්පතින්දා මඩකලපුව, අම්පාර සහ ත්‍රිකුනාමලය දිස්ත්‍රික්කවල ව්‍යාපාරික ස්ථාන සියල්ල පොදුවේ වසා දැමීමක් ප්‍රකුපිත කෙරින. විරෝධතාවයේ බලවත් අංගයක් වූයේ ප්‍රකෝපකාරී ඝාතනය යුද්ධය යලි අවුලවාවිය යන භීතිය සහ කෝපය පිලිබඳව හැඟීම ය. සුනාමිය හමුවේ දී බොහෝ සාමාන්‍ය දෙමල මුස්ලිම් සහ සිංහල ජනයා එකිනෙකාට උදව් කරගත් අතර විසි වසරක සිවිල් යුද්ධය ඇරඹීමේ කිසිදු අභිලාශයක් ඔවුන්ට නැත.

ඝාතනයට පසුදින ආතතීන් තවතවත් උත්සන්න කරමින් මිලිටරිය නැගෙනහිර පලාත ''අධි සීරුවෙන්'' තැබී ය. එල්ටීටීඊ හිතවාදී *ටැමිල්නෙට්* වෙබ් අඩවියට අනුව පොලිස් විශේෂ කාර්ය බලකාය (එස්ටීඑෆ්) විසින් මන්දානි අනාථ කඳවුරේ ජනයා කලු කොඩි එසවීමට කල ප්‍රයත්නයක් වලක්වා තිබේ. මඩකලපුව දිස්ත්‍රික්කයේ කොමාරි ප්‍රදේශයේදී කොඩියක් දැමීමට තැත් කල එල්ටීටීඊ සාමාජිකයකුට ද එස්ටීඑෆ් නිලධාරීහු පහර දුන්හ.

බදාදා පාර්ලිමේන්තුවේ උනුසුම් සැසිවාරයකදී ටීඑන්ඒ මන්ත්‍රීවරු ඝාතනය පිලිබඳව වගකීම ආන්ඩුවට පවරමින් චෝදනා කලහ. ප්‍රහාරය කලින් සැලසුම් කර, හොඳින් සංවිධානය කර තිබූ බව ද හමුදා කඳවුරු කීපයක් අසල දී සිදු වූ බව ද ටීඑන්ඒ නායක ආර්. සම්බන්දන් පෙන්වා සිටියේ ය. ''මෙම ප්‍රහාරය සාම ක්‍රියාදාමය අස්ථාවර කිරීමට එල්ල වූ'' බව සඳහන් කරමින් ඔහු ''බලගතු ලෙස හමුදාව යොදා ඇති ප්‍රදේශයකට පහර එල්ල වූයේ කෙසේ ද, එවන් හමුදාවක් සිටිය දී පසුබසින්නේ නැතිව එය සිදු කරන්නේ කවුද?'' යයි විමසී ය.

ඝාතනවලට කවර හෝ සම්බන්ධයක් ඇතැයි යන්න මිලිටරිය විසින් ප්‍රතික්ෂේප කර තිබේ. මඩකලපු ප්‍රාදේශීය අනදෙන නිලධාරී වජිර විජේගුනවර්ධන මිලිටරි ආරක්ෂාව සහිතව ගමන් කරන ලෙස දුන් හමුදා උපදේශය පිලි නොපැදීම පිලිබඳව කෞශලයන්ට දොස් පැවරී ය. එහෙත් මෙම ප්‍රකාශය පිලිතුරකට වඩා ප්‍රශ්න මතු කරයි. වැලිකන්ද හමුදා කඳවුර අසල ප්‍රදේශයකට විනිවිදීමට ප්‍රහාරකයන්ට හැකි වූයේ කෙසේ ද? චන්ද්‍රනේරුගේ වැනි රථයේ ගමන් කල අය පිලිබඳව ඔවුන් දැනගත්තේ කෙසේ ද? සටන් නැවැත්වීමේ ගිවිසුමට අනුව එල්ටීටීඊ සාමාජිකයන් ආන්ඩුවේ පාලිත ප්‍රදේශ හරහා ගමන් කරන විට මිලිටරියට ඒ බව දැනුම් දිය යුතු ය.

කොලඹ මුද්‍රිත මාධ්‍ය පවා මිලිටරියේ ක්‍රියා කලාපය ප්‍රශ්නයට ලක් කර තිබේ. ඩේලි මිරර් මෙසේ සඳහන්

කලේ යඃ ''සිද්ධිය ඇතිවූයේ හමුදා කඳවුරු දෙකක් අතර වූ ආන්ඩුවේ පාලනයේ වන ප්‍රදේශයක වන අතර කෞශල්‍යන් ඇතුලු පිරිස නිරායුධව සිටි බවද වාර්තා විය. එබැවින් ආරක්ෂක හමුදාවන්ට මෙම සිදුවීම පිලිබඳව යම් වගකීමක් දැරීමට සිදුවේ.'' පෙර සිදු වූ ගැටුම් සහ ප්‍රහාර හේතුවෙන් මෙම ප්‍රදේශය දැඩි මිලිටරි සුපරීක්ෂාව යටතේ පවතී.

එක් ශ්‍රී ලංකා රූපවාහිනී වාර්තාවකට අනුව, කරුනා නමින් වඩාත් ප්‍රචලිත, වී. මුරලිධරන් මෙහෙයවන එල්ටීටීඊයෙන් බිඳී ගිය කන්ඩායමක් ඝාතන පිලිබඳව වගකීම බාර ගෙන තිබේ. එල්ටීටීඊයේ නැගෙනහිර මිලිටරි අනදෙන්නා වූ කරුනා, 'උතුරේ' නායකයන් නැගෙනහිර වියදමෙන් බලය ඒකාධිකාරී ලෙස පාවිච්චි කරන්නේ යැයි කියමින් පසුගිය මාර්තු වේ දී බිඳී වෙන් විය. උතුරේ නායකත්වයට පහර දීමේ දී හමුදාව කරුනා කන්ඩායම සමග එක්ව ක්‍රියා කරන්නේ ය යන එල්ටීටීඊ ප්‍රකාශ මිලිටරිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙසේ වෙතත්, එල්ටීටීඊ විරුද්ධවාදීන් කුටාලිකමේ යෙදෙවීමේ ඉතිහාසයක් ඇති ශ්‍රී ලංකාවේ මිලිටරි ඔත්තු සේවය බේදයෙන් අනතුරුව කරුනා සහ ඔහුගේ සගයන්ට කොලඹ වාසස්ථාන සපයා ඔවුන් සමග සාකච්ඡා පැවැත්වූ බව පසුගිය වසරේ දී එළිදරව් විය.

ඩේලි මිරර් ලිපියකින් කරුනා සමග වන හමුදාවේ සබඳතා පිලිබඳව වැඩිදුරටත් සාක්ෂි සැපයුනි. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ දුර ඈත ගම්මානයක් වන ඔමාදියමඩුවල පිහිටි කරුනාගේ මූලස්ථානය පිලිබඳව හමුදාව දැන සිටී. ලිපියේ මෙසේ සඳහන් වියඃ කරුනාගේ සමීප සගයන් දෙදෙනෙක් (පිල්ලයියන් සහ ඉනිය බාරතී) මඩකලපු නගරයේ සිට ක්‍රියාත්මක වෙති. ''මේ දෙදෙනාව හඳුනන මඩකලපු ප්‍රදේශවාසීහු ඔවුන් නගර ප්‍රත්‍යන්තයේ ශ්‍රී ලංකා යුද හමුදා මූලික කඳවුර අසල පිහිටි මිලිටරි රහස් ඔත්තු ඒකකයෙක් වන 'පැට්පොඩි කඳවුරේ' සිට ක්‍රියාත්මක වන බව පවසති.''

## වර්ධනය වන මිලිටරි ආතතීන්

ප්‍රකාශයක් නිකුත් නොකරම බැරි බවට එක්සත් ජාතීන්ගේ මහ ලේකම් කොෆි අනන් ට හැඟීයාම පිලිබඳව කාරනාවෙන් කෞශල්‍යන්ගේ ඝාතනයෙන් ඇතිවිය හැකි බලපෑම් සලකුනු කෙරේ. ප්‍රකාශකයකුට අනුව, ''සටන්විරාම ගිවිසුමට බාධා විය හැකි ක්‍රියාවන් වලක්වනු වස් සියලු පාර්ශ්වයන් ඉවසීමෙන් හා පාලනයෙන් යුතුව ක්‍රියා කරන්නැයි'' අන්නන් උදක්ම ඉල්ලා ඇත. ශ්‍රී ලංකවේ සාම ක්‍රියාවලිය බිඳවැටීමේ මුවවිට තිබෙන බවට ප්‍රධාන ගෝලීය බලවතුන් තුල තිබෙන භීතිය අන්නන්ගේ සැඳහුම් පිටුපසින් පවතී.

සුනාමියත් සමගම විවිධාකාර අටුවාකරුවෝ ව්‍යසනය මගින් සාම කථා යලි ඇරඹීමටත් සිවිල් යුද්ධය සාකච්ඡාමය අවසානයකට ගෙන ඒමටත් කොන්දේසි සකසනු ඇතයි යන අදහස ප්‍රකාශයට පත් කලහ. උදාහරනයක් ලෙස හැටන්නැෂනල් බැංකු කොටස් බ්‍රෝකර්වරුන්ගේ පර්යේෂන ප්‍රධානියාවන හසිත ප්‍රේමරත්න මෙසේ ප්‍රකාශ කලේ යඃ ''සුනාමියේ රිදී රේඛාව වනුයේ යුද්ධය පිලිබඳ අවස්ථාව වියැකී යාම ය. එමගින් ආයෝජකයන්ගේ විශ්වාසය යලි ඇති කෙරෙන ආන්ඩුවට හා කොටින්ට (එල්ටීටීඊ) දූන් සටන් කරනවාට වඩා කිරීමට යහපත් දේ තිබේ.''

ඇත්ත වසයෙන් ම නම් ව්‍යසනය විසින් ආන්ඩුව හා එල්ටීටීඊය අතර ආතතීන් හුදෙක් තවත් ඉහල නැංවී ය. දින ගනනක් ඇතුලත උතුරේ හා නැගෙනහිර එල්ටීටීඊ පාලිත ප්‍රදේශයන්ගේ සහන සහ නැවත ගොඩ නැගීමේ කටයුතු කරගෙන යන ආකාරය පිලිබඳව දෙපාර්ශ්වය අං පටලවා ගත්හ. ඕනෑම සහන කටයුත්තක් තමන්ගේ කොන්දේසි අනුව සිදුවිය යුතු බවට කොලඹින් දැඩි ලෙස ප්‍රකාශ වෙද්දී සියලු ආධාර සිය දෙමල පුනරුත්ථාපන සංවිධානය (ටීආර්ඕ) හරහා ගලා යා යුතු යයි එල්ටීටීඊය දිගටම පැවසී ය.

ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කර සියලු සහන කටයුතු සන්නද්ධ හමුදා පාලනයට යටත්කල විට මතභේදය තවත් නරක අතට හැරින. රටේ දෙමල සුලුතරයට හිංසා පීඩා කිරීම පිලිබඳව මිලිටරිය අපකීර්තිමත් ය. යුද සමයේ දී දහස් ගනන් දෙමල ජනයා වට කිරීමට, නඩු නැතිව රඳවා තැබීමට සහ සමහර අවස්ථාවල වධ බන්ධනයට ලක්කිරීමට හදිසි නීති රෙගුලාසි භාවිතා කැරුනි. සටන් විරාමයක් පැවතුන ද, එස්ටීඑෆ් පොලිස් නිලධාරින් ආන්ඩුවේ පාලන ප්‍රදේශවල ආධාර බෙදා දීමෙන් එල්ටීටීඊ සාමාජිකයන්ව වලක්වා ලන බවට වාර්තා වී තිබේ.

එල්ටීටීඊය සහයෝගය පතා 'ජාත්‍යන්තර ප්‍රජාවට' ආයාචනා කර තිබේ. එහෙත් පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) සහන කටයුතු හරහා එල්ටීටීඊය නිලවසයෙන් පිලිගැනීමක් සිදු නොවන බවට දැඩිව කියා සිටී. කොෆි අන්නන් රටේ සංචාරය කල අවස්ථාවේ දී සුනාමියෙන් විපතට පත්, කැරලිකරුවන් අත පවතින ප්‍රදේශයකට, සංචාරය කිරීමෙන් ඔහු වැලැක්වීමට කුමාරතුංග පියවර ගන්නා ලදි. සුනාමියෙන් විපතට පත් වූවන්ට ආධාර සැපයීමට ඒකාබද්ධ යාන්ත්‍රනයක් ස්ථාපිත කිරීමට නොර්වේජියානු මැදිහත්කරුවන් ගන්නා ලද ප්‍රයත්නයන්ගෙන් කිසිවක් ඉටු නොවුනි. විදේශ ඇමති ජාන් පීටර්සන් මෙහෙයවූ ඉහල පෙල රාජ්‍ය තාන්ත්‍රික කන්ඩායමක් ජනවාරි අග භාගයේ දී ශ්‍රී ලංකාවේ සිව් දින සංචාරයක නිරත වුව ද විලංගු ගැලවීමට අසමත් විය.

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ දෙවන ප්‍රධාන හවුල්කරු වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ)

සුනාමියෙන් දිවි ගලවාගත් අයට උදව් කිරීමේ ආන්ඩුව හා එල්ටීටීඊය අතර කවර හෝ සීමිත සහයෝගී ක්‍රියාවක් වලක්වා ලීමේ දී සහ දෙමල විරෝධී ස්වෝත්තමවාදය කලතා ලීමේ දී තීරනාත්මක භූමිකාවක් ඉටු කලේ ය. එල්ටීටීඊ ප්‍රදේශවල සංචාරය කිරීමෙන් අන්නන් වැලැක්වීමේ තීන්දුව ඔජවඩවමින් ජවිපෙ කථිකයෝ එල්ටීටීඊය සමග කිසිදු ඒකාබද්ධ සහන කමිටුවක් ස්ථාපිත කිරීමට විරුද්ධ වූහ. ආධාර මුවාවෙන් මිලිටරි සැපයුම් හොරෙන් ගොඩබාන්නේ යැයි ඔවුහු එල්ටීටීඊයට සහ ජාත්‍යන්තර සහන සංවිධානවලට චෝදනා කලහ.

එල්ටීටීඊයට දෙන කවර හෝ සහනයක් කෙරේ වන මෙම වෛරය 'සාම ක්‍රියාදාමය' පිලිබඳව කොලඹ පාලන කව වල තිබෙන ගැඹුරු බෙදීම් උලුප්පා දක්වයි. ගෝලීය නිෂ්පාදන සන්තතීන් සමග රට ඒකාග්‍ර කිරීමටත් සුවිශේෂිතව ම ඉන්දියාවේ දලු ලා වැඩෙන විදේශීය ආයෝජන වාසිය ඩැහැගැනීමටත් මහා බලවතුන්ගේ පිටු බලය ඇතිව ව්‍යාපාරිකයෝ කොටසක් යුද්ධයට සාකච්ඡාමය විසඳුමක් ඉල්ලා බලපෑම් කරමින් සිටිති.

එහෙත් යුද්ධයමත් මිලිටරියේ, රාජ්‍ය නිලධරයේ හා බෞද්ධ සංඝාදිකාරයේ උදවියට බලගතු වාසි සම්පත් නිර්මානය කර දී තිබේ. 1948 නිදහසේ සිටම ධනේශ්වරය සිය දේශපානල පක්ෂවලට පදනමක් සාදා ගැනීම සඳහා ද කම්කරු පන්තිය බෙදා දැමීම සඳහා ද වන මාවතක් ලෙස දෙමල විරෝධී ස්වෝත්තමවාදය කලතමින් සිටිති. බුද්ධාගම රාජ්‍ය ආගම බවට පත්කල ව්‍යවස්ථාවෙන් 1972 දී වර්ගවාදය ව්‍යවස්ථාවට වාත්තු කරවන ලදී. මෙම දේශපාලන වාතාවරනය තුල එල්ටීටීඊය සමග වන ඕනෑම සම්මුතියක් ද්‍රෝහී කමක් ලෙස හෙලා දකිනු ලැබේ.

වර්තමාන සටන් විරාමය 2002 අප්‍රේල් මාසයේ දී එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) ආන්ඩුව විසින් අත්සන් කරනු ලැබී ය. එවකට විරුද්ධ පක්ෂයේ සිටි කුමාරතුංග මිලිටරියේ ඉහල නිලධාරීන්ගේ සහය සහ ජවිපෙ පිටු බලය ඇතිව සාම කථා බහට යටින් වල කැපීමට මාන බලමින් සිටියේ ය. කුමාරතුංග සහ ඇගේ සගයෝ එල්ටීටීඊයට කෙසේවත් දිය නොහැකි සහන දීම සහ ජාතික ආරක්ෂාව අනතුරේ හෙලීම සම්බන්ධයෙන් එජාපෙ හෙලා දැක්කහ.

2003 අප්‍රේල්හි දී එල්ටීටීඊය සාකච්ඡාවලින් ඉවත් වීමෙන් අනතුරුව 'සාම ක්‍රියාදාමය' යලි ඇරඹීමට ප්‍රයත්නයන් දරන ලදී. එහෙත් එල්ටීටීඊය උතුරේ සහ නැගෙනහිර අන්තර්වාර පාලනයක් සඳහා වන සිය යෝජනා ඉදිරිපත් කල විට කුමාරතුංග ආරක්ෂක අමාත්‍යංශයද ඇතුලු ප්‍රධාන අමාත්‍යංශ තුනක පාලනය උදුරා ගැනීමට ඇයගේ සුවිශාල ජනාධිපති බලතල භාවිතා කලා ය. තුන් මසක කල් බැලීමකින් අනතුරුව ඇය 2004 අප්‍රේල් මාසයේ නව මැතිවරනයක් සඳහා තත්වය සකස් කරමින් ආන්ඩුව පලවා හැරියා ය.

කුමාරතුංගගේ එජනිසය මැතිවරනය යන්තමින් ජයගත් නමුදු පෙර එජාපෙ ආන්ඩුව මුහුන දුන් ගැටලු කිසිවක් ම විසඳාලීමේ හැකියාවක් එයට නැති බව ඔප්පු කර පෙන්වා තිබේ. ජාත්‍යන්තර මූල්‍ය උදව් ලබාගැනීමේ උප්පරවැට්ටියක් ලෙස ජනාධිපතිනිය එල්ටීටීඊය සමග කථාබහ යලි ඇරඹීමට පොරොන්දු වූවා ය. නව මාසයකට පසුව ද තවමත් සාකච්ඡා සඳහා එකඟතා පදනමක් නැත.

'සාම' කථා යලි ඇරඹීමට පොරොන්දු වූ වහාම කුමාරතුංගට ඇගේ සගයන් වන මිලිටරියේ සහ ප්‍රථම වතාවට බලයට පැමින සිටින ජවිපෙ විරෝධතාවන්ට මුහුන දීමට සිදු විය. එල්ටීටීඊ ඉල්ලීම වන අන්තර් පාලනය මත සාකච්ඡා ආරම්භ කල හොත් ආන්ඩුවෙන් ඉවත්ව යන බවට ජවිපෙ තර්ජනය කර තිබේ. ඒ සමගම නැගෙනහිර එල්ටීටීඊයේ හා ඊට විරුද්ධ කරුනා පාර්ශ්වයේ ඝාතන රැල්ලක් ඇති වී තිබේ.

සුනාමියෙන් අනතුරුව පාලක ප්‍රභූවේ සමහර ස්ථර මිලිටරි පරාජයක් අත්කර දීමට එල්ටීටීඊයේ දුර්වල වී ඇති තත්වයේ වාසිය ඩැහැ ගන්නා ලෙස ආරක්ෂක හමුදාවන් පොලඹවනු ලැබී ය. කුමාරතුංග මත් ජනවාරි 30 පුවත්පත් සාකච්ඡාවේ දී වචන පරිස්සමින් තෝරා ගනිමින් ''එල්ටීටීඊ කේඩරයන්ට සහ කඳවුරුවලට වූ බරපතල හානි '' පිලිබඳව පෙන්නුම් කලා ය. ඇය ප්‍රසිද්ධියේ මෙමගින් යුද්ධය පිලිබඳ අන්තරාය තවත් දුරස්ත වී තිබෙන බවට තර්ක කල ද අප්‍රසිද්ධියේ මිලිටරි ගනන් බැලීම් සිදු කල බවට සැකයක් නැත.

කෞශල්‍යන් ඝාතනය පිලිබඳව සඳහන් කරමින් අයිලන්ඩ් පුවත්පතේ කතුවැකියක් සහයෝගීතාවය දක්වන ස්වරයකින් සඳහන් කලේ: ''නැගෙනහිර පෙරලා පහර දීම අරඹයි''යනුවෙනි. යලි යුද්ධයට යාමට හැකියාවක් එල්ටීටීඊයට නැති බව පෙන්වා දීමෙන් අනතුරුව ලිපිය, ''ඔවුන් එසේ කල හොත් පවතින තත්වය අනුව ඔවුන් වරද්දා ගන්නවා ඇත.'' යයි ලිවී ය. එවන් අටුවාවන් එල්ටීටීඊය කුඩු පට්ටම් කර දැමීමට අවස්ථාවක් ඩැහැ ගැනීමට උනන්දුවෙන් බලා සිටින ඉහල මිලිටරි නිලධරයේ කොටසක සිතුම් පැතුම් පිලිබිඹු කරයි. කෞශල්‍යන්ගේ ඝාතනය එල්ටීටීඊය යුද්ධයට දක්කවීමට ප්‍රයෝජනවත් මාර්ගයක් බව සැලකීමේ දී එම ඝාතනයට හමුදාවේ කොටස්වල සම්බන්ධයක් තිබීම සම්පූර්නයෙන්ම විය හැකි දෙයකි.

සුනාමියෙන් අනතුරුව රට සාමය දෙසට නොව යුද්ධය දෙසට ගමන් කරන්නේ ය යන කාරනාව පාලක පන්තියේ සියලුම කොටස්වලට එල්ල වන නිදොස් විය නොහැකි අධිචෝදනාවකි. සිවිල් යුද්ධයෙන් මිය ගිය 65,000 මත්තේ අඩු තරමින් 40,000ක වත් දිවි ව්‍යසනය නිසා අහිමි විය. ප්‍රදේශ ගනනාවක විරෝධතා ඇතිවෙමින්, සුනාමියෙන් දිවි බේරා ගත් අය තුල

ආධාර උපකාර නොමැති වීම හේතුවෙන් දනට මත් වෛරය හා කෝපය ජනිත වී තිබේ.

නෝර්වේ ජාත්‍යන්තර සංවර්ධන ඇමතිනි හිල්ඩ ජොන්සන් ඇයගේ සංචාරයේ දී කොලඹ පුවත්පත් අමතා සෘජුව ම මෙසේ පැවසී යː ''නො ඉවසීම වර්ධනය වෙමින් තිබෙන අතර (ආධාර පිලිබඳව මිනිසුන් අතර) ඊට ද වඩා කලකිරීම වර්ධනය වෙමින් පවතී. මෙය ආතතියක් බවට පත් වීමට පෙර ආන්ඩුව, එල්ටීටීඊය සහ ජාත්‍යන්තර ප්‍රජාව මේ පිලිබඳව අවධානය යෙදවීම අවශ්‍ය ය.'' කෙසේ වෙතත්, මෙම අනතුරු ඇඟවීම කෙරෙහි සැලකිල්ලක් දක්වතියි සිතිය නොහැක. කම්කරු ජනයාගේ අවශ්‍යතා තෘප්ත කිරීමේ අසමත් පාලක පන්තිය පසුගිය පනස්වසර මුලුල්லේ ම සෑම දේශපාලන අර්බුදයකදී කලා සේ ම වර්ගවාදී එදිරිවාදිකම් හිතාමතා ම අවුස්සාලමින් - එහි අර්ථය වනුයේ යලි යුද්ධයට යාම විය හැකි වුව ද - ප්‍රතිචාරය දක්වනු ඇත.

© www.wsws.org